# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2089/33 - 2018 සැප්තැම්බර් මස 19 වැනි බදාදා - 2018.09.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර :*

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 243F තිරුක්කඩලූර් ග්‍රාම සේවා වසමේ ත්‍රිකුණාමලය නගර හා කඩවත් සර්වේ ජනරාල් විසින් 2018.07.07 දිනැතිව පිළියෙල කරන ලද FVP 28 දරන පිඹුරේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.6395, හෙක්ටයාර් 3.2362 පමණ වූ කැබලි අංක 320, 323 දක්වා ඉඩමට මායිම් විස්තර පහත සඳහන් කර ඇත.

කැබලි අංක 320 – ප්‍රමාණය: හෙක්ටයාර් 0.6395.

*මායිම් :*

*උතුරට*: කැබලි අංක 26 සහ 25; *නැගෙනහිරට*: කැබලි අංක 25, 26, 25, 322 සහ 321; *දකුණට*: කැබලි අංක 321 සහ උතුරු වෙරළ පාර; *බටහිරට*: උතුරු වෙරළ පාර සහ කැබලි අංක 26 සහ 25.

කැබලි අංක 323 – ප්‍රමාණය: හෙක්ටයාර් 3.2362.

*මායිම් :*

*උතුරට*: කැබලි අංක 321, 322, 31 සහ 33; *නැගෙනහිරට*: කැබලි අංක 31, 33, 328, 327, 326 සහ 324; *දකුණට*: කැබලි අංක 328, 327, 326, 324 සහ උතුරු වෙරළ පාර; *බටහිරට*: උතුරු වෙරළ පාර සහ කැබලි අංක 321 සහ 322.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 ඔක්තෝබර් මස 22 වැනි දින පෙ. ව. 10.00 ට ප්‍රාදේශීය ලේකම් වන මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018 ඔක්තෝබර් මස 01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වාභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ජේ. එස්. අරුල්රාජ්,
ප්‍රාදේශීය ලේකම්,
නගර හා කඩවත් කොට්ඨාසය.
ත්‍රිකුණාමලය.

2018 සැප්තැම්බර් මස 11 වැනි දින,
නගර හා කඩවත් කොට්ඨාසය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.
ත්‍රිකුණාමලය.

10 - 103


1A - G 28559 - 37 (2018/09)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.